[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 40 දරන රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත

---

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 30 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 තැපැල් ගාස්තුව රු : 3.50

## 1999 අංක 40 දරන රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ හාර අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 30 වැනි දින.]

එල්.ඩී. - ඕ. 57/96.

**රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ හාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම සඳහා ද එහි පරමාර්ථ සහ බලතල නිශ්චය කොට දැක්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පවරනු ලැබේ:-

1. මේ පනත 1999 අංක 40 දරන රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ හාර අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2. (1)රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ හාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන) හාර අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ හාර අරමුදල පිහිටුවීම.

(2) අරමුදල, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් ඇත්තේය. තව ද පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි සංස්ථාපනය කරනු ලැබූ ද මහා සභාවේ මෙහෙයවීමට සහ පාලනයට යටත් වූ ද විධායක කමිටුවක් වෙත පවරනු ලැබිය යුතු ය. විධායක කමිටුව.

(2) විධායක කමිටුව :-

(අ) මහා සභාව විසින් තෝරාපත් කරනු ලබන සභාපතිවරයකුගෙන් උපසභාපතිවරුන් තිදෙනකුගෙන්, ලේකම්වරයකුගෙන්, උපලේකම්වරයකුගෙන්, භාණ්ඩාගාරිකවරයකුගෙන් සහ උපභාණ්ඩාගාරිකවරයකු ගෙන් ද ; සහ

(ආ) එක් එක් දිස්ත්‍රික් මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගමයකින් එක් නියෝජිතයකු බැගින් වූ නියෝජිතයන් සංඛ්‍යාවකගෙන් ද

සමන්විත විය යුතු ය.

H- 022545

(3) විධායක කමිටුවේ සාමාජිකයකු මියගියහොත්, සභාපතිවරයා හෝ ලේකම්වරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ, අවස්ථාවෝචිත පරිදි, මහා සභාව විසින් නැතහොත් දිස්ත්‍රික් මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගමයක් විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහු තෝරා පත් කරනු ලැබූ හෝ නම් කරනු ලැබූ දින සිට මහා සභාවේ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේ දිනය තෙක් ධුරය දැරිය යුතු ය.

මහා සභාව.

(4) විධායක කමිටුවේ සාමාජිකයන්ගේ සහ එක් එක් දිස්ත්‍රික් මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගමයකින් එක් නියෝජිතයකු බැගින් ද එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගමයකින් එක් නියෝජිතයකු බැගින් ද වූ නියෝජිතයන් සංඛ්‍යාවකින් මහා සභාව සමන්විත වන්නේ ය. විධායක කමිටුව විසින් අරමුදල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ තීරණය කිරීම මහා සභාවේ කාර්යයක් වන්නේ ය.

මහා සභාවේ රැස්වීම්.

**5**. (1) මහා සභාව වර්ෂයකට වරක් රැස්විය යුතු ය.

(2) මහා සභාවේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා විසින් කැඳවිය යුතු අතර ඒ රැස්වීමේ මුලසුන දැරීම ද ඒ රැස්වීමේ කටුතු මෙහෙයවීම ද ඔහු විසින් කළ යුතු ය.

(3) යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පිහිටුවන ලද විශ්‍රාමිකයන්ගේ සංගමයේ ප්‍රථම රැස්වීම ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් කැඳවිය යුතු අතර, ඒ රැස්වීමේ මුලසුන දැරීම ද ඒ රැස්වීමේ කටයුතු මෙහෙයවීම ද ඔහු විසින් කළ යුතු ය.

(4) යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා පිහිටුවන ලද විශ්‍රාමිකයන්ගේ සංගමයේ ප්‍රථම වාර්ෂික රැස්වීම ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කැඳවිය යුතු අතර, ඒ රැස්වීමේ මුලසුන දැරීම ද ඒ රැස්වීමේ කටයුතු මෙහෙයවීම ද ඔහු විසින් කළ යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, විධායක කමිටුව තෝරා පත් කිරීම හෝ නම් කිරීම මහා සභාවේ වාර්ෂික රැස්වීමේ දී කරනු ලැබිය යුතු ය.

(6) මහා සභාවේ වාර්ෂික රැස්වීමක දී ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන යම් යෝජනාවක් වේ නම් ඒ පිළිබඳව ලිඛිත දැන්වීමක් යටත් පිරිසෙයින් දින දහහතරකට පෙර මහා සභාවේ යම් සාමාජිකයකු විසින් ලේකම්වරයා වෙත දිය යුතු ය.

(7) මහා සභාවේ වාර්ෂික රැස්වීමේ න්‍යාය පත්‍රය, ඒ රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් දින හතකට පෙර, ලේකම්වරයා විසින්, මහා සභාවේ සියලුම සාමාජිකයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**6**. මහා සභාවේ වාර්ෂික රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය මහා සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකින් සංයුක්ත වන්නේ ය.

වාර්ෂික රැස්වීම්වල ගණපූරණය.

**7**. (1) විධායක කමිටුව යටත් පිරිසෙයින් මසකට වරක් රැස්විය යුතු ය.

විධායක කමිටුවේ රැස්වීම්.

(2) හදිසි කාරණා ගැන සාකච්ඡා කිරීම සඳහා මහා සභාවේ විශේෂ රැස්වීමක් විධායක කමිටුව විසින් කවර විටක වුවද කැඳවනු ලැබිය හැකි ය.

(3) එවැනි විශේෂ මහා සභා රැස්වීමක න්‍යාය පත්‍රය, ඒ රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් දින හතකට පෙර, ලේකම්වරයා විසින්, මහා සභාවේ සියලුම සාමාජිකයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(4) මහා සභාවේ යම් විශේෂ රැස්වීමක් කැඳවීමේ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාරණය හැර වෙනත් කිසිදු කාරණයක් ගැන ඒ රැස්වීමේ දී කටයුතු නොකළ යුතු ය.

**8**. විශේෂ මහා සභා රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය මහා සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකින් සංයුක්ත වන්නේ ය.

විශේෂ මහා සභා රැස්වීමක් සඳහා ගණපූරණය.

විධායක කමිටුවේ රැස්වීම්.

**9**. (1) විධායක කමිටුවේ සෑම රැස්වීමකම මූලසුන සභාපතිවරයා විසින් දැරිය යුතු ය. විධායක කමිටුවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක දී උපසභාපතිවරුන්ගෙන් කෙනෙකු ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(2) විධායක කමිටුවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කරනු ලැබිය යුතු කාරණා සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, මේ පනතේ විධිවිධානවලට සහ ඒවා යටතේ සාදන ලද රීතිවලට යටත්ව, විධායක කමිටුව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(3) විධායක කමිටුවේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පරිපාටියක්, විධායක කමිටුවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ කමිටුවට සාමාජිකයන් තෝරා පත් කිරීමේදී හෝ නම් කිරීමේදී සිදුවී ඇති යම් දෝෂයක් කරණකොට ගෙනම පමණක් අවලංගු නොවන්නේය.

අරමුදලේ පරමාර්ථය.

**10**. විශ්‍රාමිකයන්ට තමන්ගේ තත්ත්වය සහ ගරුත්වය පවත්වාගෙන යාමට ආධාර කිරීමෙන් ඔවුන්ගේ සාමාන්‍ය ශුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම අරමුදලේ පරමාර්ථය වන්නේ ය.

විධායක කමිටුවේ බලතල සහ කර්තව්‍ය.

**11**. (1) අරමුදලේ පරමාර්ථය ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික සියලු දේ මහා සභාවේ විධානවලට සහ පාලනයට යටත්ව අරමුදලේ නමින් සිදු කිරීමට බලය විධායක කමිටුවට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියකින් තොරව, පහත දැක්වෙන බලතල විධායක කමිටුවට ඇත්තේ ය :-

(අ) යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ කුලියට ගැනීමට හෝ දීමට, ඔඩපනය කිරීමට සහ විකිණීමට හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමට;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු ගිණුම් ආරම්භ කොට පවත්වාගෙන යාමට ;

(ඈ) අරමුදල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ යෙදවීම ;

(ඇ) අරමුදලේ පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට එළඹීමට ;

(ඉ) අරමුදලේ පරමාර්ථය ඉටු කර ගැනීමට ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ සිදු කිරීමට.

**12**. විධායක කමිටුව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන් භාරයේ අරමුදලේ මුද්‍රාව තිබිය යුතු ය. විධායක කමිටුවේ අනුමතිය ඇතිව සහ සභාපතිවරයා සහ භාණ්ඩාගාරිකවරයා හෝ උපසභාපතිවරයකු හෝ උපලේකම්වරයකු ඉදිරිපිට දී මිස අරමුදලේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය. තවද, ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය. අරමුදලේ මුද්‍රාව.

**13**. විශ්‍රාමිකයකුට ගෙවිය යුතු මාසික විශ්‍රාම වැටුපෙන් අඩුකර ගැනීමට ඒ විශ්‍රාමිකයා ලිඛිතව කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම්, තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් ඒ විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුපෙන් අඩුකර ගනු ලැබිය හැකි ය. මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර කරනු ලබන සියලු අඩුකිරීම් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. විශ්‍රාම වැටුපෙන් මාසිකව අඩු කර ගැනීම්.

**14**. පහත දැක්වෙන මුදල් ප්‍රමාණ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :- අරමුදලට බැර කළ යුතු ගෙවීම්.

(අ) 13 වන වගන්තිය යටතේ කරනු ලබන සියලු අඩුකර ගැනීම් ;

(ආ) දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් අරමුදලට ලබාගනු ලබන සියලු මුදල්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ;

(ඇ) අරමුදල විසින් කරනු ලැබ ඇති ආයෝජනවලින් ලැබෙන සියලු ආදායම් ;

**15**. පහත දැක්වෙන මුදල්, අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය :-

(අ) අරමුදලේ ක්‍රියාකාරිත්ව, අරමුදල පිහිටුවීම සහ අරමුදල පවත්වාගෙන යාම සඳහා දරනු ලබන සියලු වියදම්; සහ

(ආ) අරමුදලේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය වන්නේ යයි විධායක කමිටුව විසින් අනුමත කරනු ලබන හෝ අරමුදලෙන් ගෙවීම සඳහා මේ පනතින් බලය දී ඇති හෝ වෙනත් සියලු ගෙවීම්.

ගිණුම් සහ විගණනය.

**16**. (1) අරමුදලේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තැබීමට විධායක කමිටුව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) අරමුදලේ ගිණුම්, ගතවූ වාර්ෂික මහා සභා රැස්වීමේ දී මහා සභාව විසින් තෝරා පත් කර ගනු ලැබූ සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) එක් එක් වර්ෂයේ අරමුදලේ ආදායම සහ වියදම ද ඒ වර්ෂය තුළ දී අරමුදලේ මුදල් යොදවා ඇති ආයෝජන ද පිළිබඳ ප්‍රකාශයත් සමඟ, ඒ වර්ෂයේ අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක්, ඒ වර්ෂයේ දෙසැම්බර් තිස්එක් වන දිනෙන් පසු හැකිතාක් ඉක්මනින්, (2) වන උපවගන්තියේ සඳහන් විගණකවරයා විසින් පිළියෙල කළ යුතු ය. විගණකවරයා විසින් ඒ වාර්තා විධායක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු අතර. එහි පිටපතක් විධායක කමිටුව විසින් මහා සභාවේ ඊළඟ මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් –

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද යම් තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එහි ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

රීති සෑදීමේ බලතල

**17**. මහා සභාව විසින් විධායක කමිටුව තෝරා පත් කිරීම, දිස්ත්‍රික් මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගම්වලින් විධායක කමිටුවට නියෝජිතයන් තෝරා පත් කිරීම, මහා සභාවේ රැස්වීම් කැඳවීම හා ඒ රැස්වීම්වල කටයුතු ද දිස්ත්‍රික් මට්ටමේ සහ කොට්ඨාස මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගම්වලට අදාල සියලු කාරණා ද සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම ඇතුළුව, විධායක කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට බලපාන හෝ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කාරණා කිසිවක් සම්බන්ධයෙන් අවශ්‍ය යයි විධායක කමිටුව අදහස් කරන රීති විධායක කමිටුව විසින් සාදනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ විධායක කමිටුව විසින් කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් විධායක කමිටුවේ සාමාජිකයන් ආරක්ෂා කිරීම.

**18**. (1) විධායක කමිටුවේ යම් සාමාජිකයකු හෝ අරමුදලේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ විධායක කමිටුවේ විධානය මත හෝ සද්භාවයෙන් කරනු ලැබූ නැතහොත් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අරමුදල විසින් හෝ අරමුදලට එරෙහිව හෝ යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අරමුදල විසින් දරන ලද යම් වියදමක් අරමුදලේ මුදල්වලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අරමුදලට ගෙවනු ලැබූ හෝ අරමුදල විසින් අයකරගනු ලැබූ යම් නඩු ගාස්තුවක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි විධායක කමිටුවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකු හෝ විසින් මේ පනත යටතේ හෝ විධායක කමිටුවේ විධානය මත හෝ කරනු

ලැබූ නැතහොත් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් කරන ලද්දේ සද්භාවයෙන් බව අධිකරණය විසින් අදහස් කරන්නේ නම්, ක්‍රියාව සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක් වේ නම්, ඔහු විසින් ඒ වියදම සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකරගෙන නොමැති නම්, ඒ වියදම අරමුදලේ මුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

විධායක කමිටුවේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපලවලට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**19**. අරමුදලට විරුද්ධව ගෙන යනු ලැබූ යම් නඩුවක දී විධායක කමිටුවේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**20**. අල්ලස් පනතේ අර්ථානුකූලව, අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**22**. මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, -

" දිස්ත්‍රික් මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගමය" යන්නෙන්, යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පිහිටුවනු ලැබූ විශ්‍රාමිකයන්ගේ සංගමයක් අදහස් වේ ;

"ප්‍රාදේශීය මට්ටමේ විශ්‍රාමිකයන්ගේ සංගමය" යන්නෙන්, ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කොට්ඨාසයක් සඳහා පිහිටුවනු ලැබූ විශ්‍රාමිකයන්ගේ සංගමයක් අදහස් වේ ;

"විශ්‍රාමිකයා" යන්නෙන්,

(අ) රජයේ නිලධරයකු වශයෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ සංස්ථාපිත පළාත් පාලන සේවයේ සාමාජිකයකු වශයෙන් හෝ සන්නද්ධ හමුදාවක සාමාජිකයකු වශයෙන් ඉටු කරන ලද සේවය ප්‍රකාර, ආණ්ඩුව විසින් සපයනු ලබන අරමුදල්වලින් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තෙක් ;

(ආ) (අ) ඡේදයේ සඳහන් තැනැත්තෙකුගේ වැන්දඹු භාර්යාව හෝ වැන්දඹු පුරුෂයා හෝ අනාථයකු හෝ වීම හේතුකොට ගෙන ආණ්ඩුව විසින් සපයනු ලබන අරමුදල්වලින් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තෙක්,

අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.